රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.03.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම</u>

2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හී 11.2 සහ 11.3 වගන්තින්හී වර්ගීකරණට අනුව මාණ්ඩලික නිලධර ගණයට අයත් වන රජයේ නිලධරයන් හැර අනෙකුත් රජයේ නිලධරයන් සඳහා වාර්ෂික අය වැය ඇස්තමේන්තුවල II කොටසේ අත්තිකාරම් ගිණුම්වල, “රජයේ නිලධරයන්ට අත්තිකාරම්” යන ශීර්ෂය යටතේ ලබා දී ඇති ණය වෙනුවෙන් මෙම වසරේ අප්‍රේල් සහ මැයි මාස සඳහා අයවිය යුතු ණය වාරික සහ ණය පොලිය එම නිලධයන්ගේ වැටුපෙන් අය නොකළ යුතුය.

02. 2020 අප්‍රේල් මස වැටුප, අප්‍රේල් මස 08 දින ගෙවීමට කටයුතු කරන අතර, ඒ අනුව මේ වසරේ සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් උත්සව අත්තිකාරම් ගෙවීමට කටයුතු කරනු නොලැබේ.

03. මෙම චක්‍රලේඛය ජනාධිපති කාර්යාලයේ උපදෙස් මත හා මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය